# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හි පවතින පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත්, යෝග්‍යතා සපිරි, ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර : 1. ගණකාධිකාරී,**

**සුදුසුකම් :**

(අ) බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / කළමනාකරණය / වානිජ්‍යය පිළිබඳ ප්‍රථම උපාධියක්.

   සහ

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුලත්, තනතුරට අදාළ ක්ෂේත්‍රයක, අවම වශයෙන් එක් වසරක, පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයකින් ලත් අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

   සහ

   තනතුරට අදාළ ක්ෂේත්‍රයක, අවම වශයෙන්, එක් වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

(ආ) අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් විසින් ලබාගත යුතු සුදුසුකම් ලබා ගැනීම.
2. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක, කනිෂ්ඨ කළමනාකරු (JM) ප්‍රවර්ගයේ තනතුරක, අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 චක්‍රලේඛයට අනුව, ඉහත තනතුරට, MM 1-1-2016 රු. 53,175-10X1,375-15X1,910-95,575 ක වැටුප් පරිමාණයක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත්කිරීම් බලධාරියා විසින් පනවන ලැබූ මණ්ඩලයක් / පැනලයක් විසින් පවත්වනු ලබන, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

- අදාළ පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් - ලකුණු 30
- වෙනත් සාක්ෂාත් කර ගැනීම් (ජයග්‍රහන) - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය - ලකුණු 25

ලකුණු 100

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ලැබේ.

**වෙනත්** : මෙම ප්‍රවර්ගයේ / කාණ්ඩයේ සියලු බඳවා ගැනීම්, මෙකී බඳවාගැනීම් යෝජනා ක්‍රමයේ විධිවිධානවලට තදින්ම / දැඩිව අනුකූලවම සිදුකරනු ලැබේ.

සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකිය පුරවැසියන් විය යුතුය.

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරට පැවරෙන රාජකාරි කටයුතු මනාව ඉටුකිරීමට හැකි වනසුළු ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

විශිෂ්ඨ හා අනර්ඝ චරිතයකින් යුක්ත විය යුතුය.

**අමතර ප්‍රතිලාභ** : අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම් සේවාලාභියාගේ වැටුපෙන් අවම වශයෙන් 10% ක් වන මුදලක් සේවක අර්ථසාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියේ අර්ථසාධක අරමුදලට දායකවීම එම (SLSPC) (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව) විසින් එකී අර්ථසාධක අරමුදලට, ඔබගේ වැටුපෙන්, උපරිම වශයෙන් 12% සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% ක් වශයෙන් දායක වනු ඇත.

**අයදුම්පත්** : අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත්, සියලු විස්තර තොරතුරු හා උප්පැන්න සහතිකය අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමග, ලිපි කවරයේ, වම්පස ඉහළ කෙළවරේ, අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර පහත දැක්වෙන ලිපිනයට, ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව).

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශද සමග ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :**

පහත සඳහන් ලිපිනයට 2022 මාර්තු මස 18 වන දිනට හෝ පෙර

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 21, BCC පරිශ්‍රය, මීරානියා වීදිය, කොළඹ 12.**
**2022-03-01**